# කෝට්ටේ උඩුගම්පල උප රාජධානියේ සකලකලාවල්ලභ රජු විසින් කරවන ලද ඉපැරැණි ශ්‍රී ලංකාවේ විශාලතම රාජකීය පොකුණ (උඩුගම්පොල පතහ) ආශ්‍රිත උරුමකළමණාකරණය පිළිබඳව නැවත විමසා බැලීමක්

**කේ. උදේනි අරුණසිරි**

නිබන්ධක, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
udenisjp@yahoo.com


## හැඳින්වීම

ගම්පහ දිස්ත්‍රික්කය ඉපැරැණි ලංකාවේ බෙදීම් අනුව මායා රටට ද, පෘතුග්‍රීසි හා ලන්දේසි බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී පහත රටට ද, ක්‍රි. ව. 1829 දී සර් විලියම් කෝල්බෲක් උඩරට හා පහත රට ඒකාබද්ධ කර රට පළාත් පහකට බෙදා වෙන් කිරීමෙන් පසු බස්නාහිර පළාතට ද, නූතන පළාත් බෙදීම අනුවද බස්නාහිර පළාතට අයත් වේ. ඓතිහාසික වශයෙන් වැදගත් කමක් ඇති මෙම දිස්ත්‍රික්කයේ දැනට ශේෂවී පවතින පුරාවිද්‍යාත්මක උරුමයන් අතරින් කෝට්ටේ රාජධානි සමයට අයත් වන උඩගම්පොල උප රාජධානි ප්‍රදේශයේ සකලකලා වල්ලභ රජු විසින් කරවන ලද රාජකීය පොකුණේ (උඩුගම්පොල පතහ) ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යාත්මක වැදගත්කම අධ්‍යයනය කිරීමත් දැනට මෙම පොකුණ ආශ්‍රිතව සිදු කරමින් පවතින උරුමකළමණාකරණ ක්‍රියාවලියේ අනුකූලතාවය පිළිබීඳව නැවත විමසා බැලීමත් මෙම පර්යේෂණ පත්‍රිකාවේ මුඛ්‍ය අරමුණු වේ.

ශ්‍රී ලංකා ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය වන කොළඹ දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටි ගම්පහ දිස්ත්‍රික්කය සීඝ්‍රයෙන් ආර්ථික දියුණුව කරා ළඟා වෙමින් පවතින භූමි ප්‍රදේශයක් ලෙස හිඳුන්වාදිය හැකිය. මෙසේ ආර්ථික දියුණුව කර ළඟාවීමේ දී උක්ත ප්‍රදේශයේ පවතින පුරාවිද්‍යා උරුමයන්ගේ වටිනාකම් ආරක්ෂාවන ආකරයට එම සංවර්ධන ඉලක්ක සපුරා ගන්නේද හා එම උරුමයන් එම ප්‍රදේශයේ සංවර්ධනය සිදහා උපයෝගී කරගනු ලබන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටළුව වන අතර සකලකලාවල්ලභ රජු විසින් කරවන ලද රාජකීය පොකුණ (උඩුගම්පොල පතහ) මුඛ්‍ය ස්ථානය ලෙස යොදාගෙන මෙම පර්යේෂණය සිදුකරන ලදි.

වර්තමානයේ උඩුගම්පොල පතහ ලෙස ජනප්‍රවාදයේ හා ලේඛනාරූඪව ඇති සකලකලාවල්ලභ රජු දියනෑ මෙම පොකුණේ ඓතිහාසික වැදගත්කම විමසීමේ දී වංශකතා වලින් පිටුවහලක් නොලැබෙන අතර කෝට්ටේ රාජධානි සමයේ දී රචනා වූ සාහිත්‍ය මූලාශ්‍ර මගින් යම් එළියක් ලබාගත හැකිවේ. කෝට්ටේ රාජධානි සමය පිළිබීඳව එළිදක්වා ඇති පර්යේෂණ ග්‍රන්ථ හා සකලකලාවල්ලභ රජු ප්‍රමුඛ උඩුගම්පොල උප රාජධානිය පිළිබීඳව පවතින ජනප්‍රවාද ඔස්සේ දත්ත රැස්කිරීම සිදුකරන ලදි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙම පොකුණේ පර්යේෂණ කැණීමක් සිදුකර ඇති අතර එමගින් ලබාගත් දත්තයන් ද, අදාල ක්ෂේත්‍රයේ සිදුකරන ලද අධ්‍යයනයන් මගින් රැස්කරගත් දත්තයන් ද මෙහිදී උපයුක්ත කරගන්නා ලද අතර පුරාවිද්‍යා සංරක්ෂණය හා උරුමකළමණාකරණය සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සම්මත කරගෙන ඇති ප්‍රඥප්ති මත පිහිටා දත්ත විග්‍රහ කරනු ලැබේ.

උඩුගම්පොල පිහිටා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර දේශාංශ 79°-59°ත් උතුරු අක්ෂාංශ 7°-5 1/2° ත් අතර ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලයේ (උතුරු) දාසිය පත්තුවේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළය. ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ දක්වා දිවෙන



මහාමාර්ගයේ ගම්පහට සැතපුම් දෙකක් පමණ දුරින් මෙම ප්‍රදේශය පිහිටා තිබෙන අතර වර්තමානයේ මෙය ග්‍රාමීය ප්‍රදේශයකට සීමා වූවද පැරණි කෝට්ටේ රාජධානි සමයේ දී උඩුගම්පොල කේන්ද්‍ර කොටගෙන විශාල ප්‍රදේශයක උපරාජධානියක් වූ බවට සාධක ඇත.

අට වැනි ශ්‍රී වීරපරාක්‍රමබාහු (ක්‍රි.ව. 1477-1496) නමින් කෝට්ටේ රජවූ අම්බුළුගල රජුට සිය අගබිසවගෙන් දරුවන් සතර දෙනෙකු ලැබුණු අතර අග බිසවගේ සොහොයුරිය සරණ කරගත් පසු ඇයගෙන් තවත් දරුවන් දෙදෙනෙකු ලැබුණි. එම දෙදෙනා නම් උඩුගම්පොල විසූ සකලකලාවල්ලභ රජු සහ කටුපිටි මාදම්පේ විසූ තනියවල්ලභ රජුය. අට වැනි ශ්‍රී වීරපරාක්‍රමබාහු රජුගෙන් පසුව ධර්ම පරාක්‍රමබාහු කුමරු රජ බවට පත්වූ අතර ඔහුගේ වසර 22ක රාජ්‍ය කාලයෙන් පසු ඔහුගේ බාල මලණුවන් විජයබාහු කුමරු රජ බවට පත්වූයේ සකලකලාවල්ලභ රජුගේ පූර්ණ අනුදැනුම ඇතිවය. මෙම අවධියේ උඩුගම්පොල උප රාජධානියක් ලෙස පැවති බව හා එහි රජු ලෙස සකලකලාවල්ලභ රජු ක්‍රියාකළ බව තහවරු වේ.( දේවප්‍රිය 2000: 16,17) කෝට්ටේ රාජධානිය ආක්‍රමණිකයින්ගෙන් ආරක්ෂා කරගැනීමට ඉතා විශාල මෙහෙයක් කළ මොහු ප්‍රදේශයේ වාරි කර්මාන්ත දියුණුකොට ආර්ථික සංවර්ධනයක් කරා ගෙනයාමට උත්සාහ කර තිබේ.

සකලකලාවල්ලභ රජුගේ නාන පොකුණ තැනුණේ දැනට මාළිගාගොඩැල්ල උත්තරාරාම විහාරය ආසන්නයේ පිහිටි පතහ යන ප්‍රදේශයේය. උක්ත විහාරස්ථානය පිහිටා ඇති භූමියේ රජුගේ මාළිගය ගොඩනගා තිබූ බව සැලකේ. පොකුණට ජලය ලබාගෙන ඇත්තේ රජු විසින් බන්දවන ලද අස්වාන් වැවෙන් වන අතර එහිදි භූගත නළ මාර්ගයක් මගින් සැතපුම් දෙකක පමණ දුරක් ජලය ගෙනා බවට ජනප්‍රවාදයේ පවතී. (දේවප්‍රිය 2000: 90) වර්තමානයේදී ද පොකුණට ජලය ලැබෙන නොසිඳෙන ජල උල්පතක් දැකගත හැකි අතර ප්‍රදේශයේ වැසියන් ප්‍රකාශ කරන්නේ අස්වාන් වැවේ සිට ජලය ගෙන ආ නළ මාර්ගය එය බවයි. නමුත් එය පුරාවිද්‍යාත්මකව සනාථ කොටගෙන නොමැත. පොකුණේ වර්තමානය වන විට ශේෂව පවතින පුරාවිද්‍යාත්මක අවශේෂයන් ලෙස පොකුණ වටා බැඳ ඇති කබොක් බැම්ම, රජු දියට පැනීමට භාවිතා කළා යැයි සැලකෙන ගල් ලෑල්ල හා පොකුණ වටා පිහිටා තිබූ දිය අගලේ සාධක වැදගත් වේ.

අනුරාධපුර ඇත් පොකුණටත් වඩා විශාලත්වයකින් යුක්ත මෙම පොකුණ වර්තමානයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කරමින් පවතින අතර ඊට අමතරව ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ ගම්පහ මිනුවන්ගොඩ මාර්ගයට සම්බන්ධවන ආකාරයට පොකුණේ කබොක් බැම්මට ඇතුලතින් දිවෙන ලෙස ව්‍යායාම සිදහා ඇවිදීමේ පථයක් හෙවත් මාර්ගයක් (Jogging track) ඉදිකරමින් පවතී. පොකුණ වටා පිහිටි පොකුණේ බැම්මට ඇතුළතින් ඉදිකරමින් පවතින මෙම ව්‍යායාම පථය ඉදිකිරීමේදී පොකුණ ඇතුළත විශාල ප්‍රමාණයක් පස් යොදා ගොඩකර ඇති අතර එමගින් එහි 1/5 පමණ ප්‍රමාණයක් ගොඩවී තිබේ. කාලයාගේ ඇවෑමෙන් වල් බිහිවී කෙත් යායක් බවට පත්වී තිබූ පොකුණ මතුකොටගෙන සංරක්ෂණය කරමින් ප්‍රදේශයේ සංවර්ධනයට උපයෝගී කරගැනීම වැදගත් ක්‍රියාමාර්ගයක් වන අතර නමුත් එහිදී එම කටයුතු සිදුවන්නේ ජාතික හා ජාත්‍යන්තර උරුමකළමණාකරණ හා සංරක්ෂණ ප්‍රඥප්තීන්ට අනුවද යන්න නැවත විමසා බැලිය යුතු වන්නේ එය 2002 වසරේදී ආරක්ෂිත ස්මාරකයක් බවට පත්කර ඇත නිසාම නොව ජාතියේ වටිනා දායාදයක් ද වන බැවිනි.

**ආශ්‍රෙය ග්‍රන්ථ**


අලකේශ්වර යුද්ධය, සංස්. ඒ.වී. සුරවීර, රත්න පොත් ප්‍රකාශකයෝ, 1965

දේවප්‍රිය සිරිසේන ඕ ගම්පහ දිසාව, සීමාසහිත දීපානි මුද්‍රණ ප්‍රකාශන, 464, හයිලෙවල් පාර, ගංගොඩවිල ඕ2000

ප්‍රියංගා ඩී.එම්.එස්.ආර්, පුරාවිද්‍යාත්මක උරුමය සහ සංවර්ධනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 7, 2008

රාජාවලිය, සංස්. ඒ.වී. සුරවීර, සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම,41, ඩබ්.ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2. 1976

මඩවල බර්ටි, පෘතුගීසින්ගෙන් රට බේරාගත් සකලකලා වල්ලභයන්ගේ උඩුගම්පොල රාජධානිය http://www.divaina.com/2009/09/16/feature03.html

perera sugath, The largest pond from ancient Sri Lanka, 2013.09.07, http://www.ceylontoday.lk/35-12064-news-detail-the-largest........

ICOMOS - Venice Charter

ICOMOS(Australia) - Bara charter

1978 නාගරික සංවර්ධන අධිකාරි පනත